# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.15 පැය 1610 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/68 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**සමස්ත ලංකා ත්‍රීරෝද රථ උපාංග කොටස් නිෂ්පාදකයන් හා අලෙවිකරුවන්ගේ සංගමයේ සාමාජිකයන් සහ පොලිස්පතිතුමා අතර සාකච්ඡාවක් - පොලිස් මූලස්ථානය.**

සමස්ත ලංකා ත්‍රීරෝද රථ උපාංග කොටස් නිෂ්පාදකයන් හා අලෙවිකරුවන්ගේ සංගමයේ උප ලේකම්, සහ එහි සාමාජිකයන් 2025.01.15 වන අද දින පොලිස්පතිතුමා සමඟ සාකච්ඡාවක් සඳහා පොලිස් මූලස්ථානයට පැමිණෙන ලදී.

මෙම සාකච්ඡාව සඳහා බස්නාහිර පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති මහින්ද ගුණරත්න මහතා, නීති දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති රුවන් ගුණසේකර මහතා, රථවාහන හා මාගර් ආරක්ෂාව දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති ඉන්දික හපුගොඩ මහතා, පොලිස් ප්‍රවාහන කොට්ඨාසය භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි මංජුල මහගිරිල්ල මහතා හා පොලිස් මාධ්‍ය ප්‍රකාශක ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි බුද්ධික මනතුංග මහතා ඇතුළු උසස් නිලධාරීන් කණ්ඩායමක් සහභාගී විය.

එහිදී, සමස්ථ ලංකා ත්‍රිරෝද රථ උපාංග කොටස් නිෂ්පාදකයන්ගේ සහ අලෙවිකරුවන්ගේ සංගමයේ සාමාජිකයින් විසින් ඔවුන්ගේ කමර්ාන්ත ශාලා වැසීයාම හා ඔවුන්ගේ රැකියා අහිමිවීම සම්බන්ධයෙන් පොලිස්පතිතුමා සමඟ සාකච්ඡා කෙරිණි.

ඒ අනුව, 2021 වෂර්යේ නිකුත් කරන ලද අංක 22/40/37 දරන ගැසට් පත්‍රය මඟින් ත්‍රිරෝද රථවල අමතර උපාංග සවි කල හැකි නෛතික රාමුව හා සීමාවන් පිළිබඳව සහ එයට අනුකූලව ත්‍රිරෝද රථවල නීත්‍යානුකූලව සවිකර ඇති කොටස් ඉවත් නොකිරීමටත්, එසේ නොවන අන්තරාදායක ආකාරයෙන් සවි කර ඇති කොටස් ඉවත් කිරීමට කටයුතු කරන බවටත් දැනුම් දුන් අතර, ලබා දී ඇති මාස 03ක සහන කාලය තුල ත්‍රිරෝද රථ රියදුරන් දැනුවත් කර එම නීත්‍යානුකූල නොවන අමතර කොටස් ඔවුන් ලවා ඉවත් කරවීමට මෙහිදී සාකච්ඡා විය.

ත්‍රිරෝද රථ උපාංග කොටස් නිෂ්පාදකයන්ගේ සහ අලෙවිකරුවන්ගේ රැකියා අහිමි කිරීමට ශ්‍රී ලංකා පොලිසිය කිසිවිටකත් කටයුතු නොකරන බවට දැනුවත් කළ අතර විශේෂයෙන්ම මේ සීමාවන් පනවා ඇත්තේ මාගර්ය භාවිතා කරන සෙසු පුද්ගලයන්ගේ, ත්‍රිරෝද රථ රියදුරන්ගේගේ හා එහි ගමන් ගන්නා මගීන්ගේ ආරක්ෂාව වෙනුවෙන් බවටත් වැඩිදුරටත් පොලිස්පතිතුමා විසින් ඔවුන් දැනුවත් කරන ලදී.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**